# සෙබළ සිතුවිලි දෙසතිය

2025
ජූලි
01 - 15
වෙළුම
XLVI

ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රකාශණයකි



# මව්බිමට කැපවූ රණවිරුවා

සඳකිඳුලක් වැනි නෙත් ඇස් වලින්
උනන්දුවෙන් දුටු මව්බිම
පෙම්වතා සේ ආදරෙන්
එම මඟට ලංවෙලා දිවගියා.

නැඟී හිඳී උතුම්ව ඔබේ නම
රන්වන් ගඟක් වැනි සිහිනයක
ඔබේ ලේ සලකුණු වී ඇත
අපේ නිදහස ලියණු වදන් වල

අපේ හුස්මක් විය ඔබ
අපේ ගීතේ පදවල් විය
මව්බිම හදවතක තැබූ
ඔබේ නම සදාකාලිකව දිලිසෙයි

සන්සුන් වූ මව්බිමේ
අපි ජීවිතය ගෙවමු ඔබේ මතකයෙන්
මවකගේ ඇස් වලට ඔබ තවම
රන්වන් වීරයෙකු සේ දිලෙයි සදාකාලයේ


**කෝප්‍රල් ඉසුර මධුසංඛ ඩබ්ලිව්කේ**
**12 ගැහේබ**

# ඔබ මගේ හදවතේ පහන්

ඔබ නොමැති දිනකදී
සඳ පවා නිවී යයි
ඔබේ සිනහව පමණි
මට සතුට දෙන අරුණෝදය.

ඔබේ නෙත් රුදෙනෙ විට
මගේ සිත සන්සුන් වේ
ඔබෙන් දුරස් වන්නට
මේ හද පෑදේ නොහැකී...

ඔබ නැති ලෝකය
සන්සුන්වක් රහිත කලාපය
කඳුළින් මැවූ පැතුමක්
දෙතොල් යට හැංගෙන ගීයකි.



ලාන්ස් කෝප්‍රල් හරිහරන් සීවම්
1 ශ්‍රීලයුපොදුසේබ



# මිනිසත්කම

කියන්න....
හිතක් රිදෙන වචනයක් නෙවෙයි
හිතක් හැදෙන වචනයක්..
බලන්න...
රවලා ඔරවලා නෙවෙයි
ලස්සනට හිනාවෙලා
දකින්න..
හැමදේම වැරදිම නෙවෙයි
හොඳ පැත්තෙන්..
හිනාවෙන්න..
සමච්චලයට නෙවෙයි
මුළු හදවතින්ම..


කෝප්‍රල් වීරසේකර ඩීබීඑන්ජී
8 ගැහේබ



# අම්මා

දැලි ඉඳුල් පිහ දදා
චීත්තේ පිට පොටේ
හැම උදේ ඈ තැබුවේ
බුදු සරණයි මගේ හිසේ
බත් මුල එතුවට
ඇගේ රස අත් ගුණේ
අම්මා කවදත් කෑවේ
හීල් බත් දංකුඩේ...

ලාන්ස් කෝප්‍රල් ලලිත් කුමාර බීඑස්කේ
16 ගරෙ



# හදවත

සුසුම් සලන හන්තානක
කඳුළු ගලන මද්දහනක
සුදු පැහැ මලක් වෙලා
නුඹ පිපුනිද මගේ ලොවට
ඈ ගියාලු මං දොලා
සුසුම් කඳුළු රන්දාලා
හැර යන කඳුලද සුසුමද
යන්න එපා මං දාලා...

රයිෆල් සෙබළ සේනානායක එස්එම්එසඑන්
14 ශ්‍රීලංසිරෙ

# සෙබළ සිතුවිලි

ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රකාශනයකි



ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය | www.army.lk | 011 2076967